# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 මැයි මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.05.03 දින නිකුත් කරන ලදී)**

# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 36.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "ඉලෙක්ට්‍රොනික" යන යෙදුමේ අර්ථ නිරූපනය ඇතුළත් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පැමිණිලිකාර පාර්ශ්වකරුවකු හෝ විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ යම් අධිකරණයක ප්‍රාදේශීය බලසීමාව තුළ ද, ඒ අධිකරණයෙහි නඩු පැවරීමට අවසර ලබාදීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ලේඛනගත නීතිඥවරයකු පත්කිරීමක සඳහන් විය යුතු කරුණු සහ පත්කිරීම සිදු කළ යුතු ආකාරය නිශ්චිතව දැක්වීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පළමුවන උපලේඛනයේ 16අ දරන ආකෘතියට සාරානුකූල වූ සංදේශයක් මගින් යම් තොරතුරු ඉදිරිපත් කළයුතු බව අවශ්‍යතාවය දැක්වීම සහ යම් පාර්ශ්වයක් වෙත භාර දෙනු ලැබීමට නියමිත යම් දැන්වීමක් හෝ යම් නෛතික ලේඛනයක් භාරදෙනු ලැබිය යුතු ආකාරය නිශ්චිතව දැක්වීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, සිතාසි භාර දීම සම්බන්ධයෙන් නව ප්‍රතිපාදන කිහිපයක් ඇතුළත් කිරීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, සිතාසි පෞද්ගලිකව භාර දීම සඳහා ප්‍රතිපාදන සැලසීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, සිතාසි භාර දීම ඔප්පුකිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම වේ.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, අනුයෝජිතයා වෙත සිතාසි භාරදීම හෝ නිශ්චල දේපළ මත ඇලවීම සඳහා ප්‍රතිපාදන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, බන්ධනාගාරයෙහි සිටින විත්තිකරුවකු වෙත සිතාසි භාර දීම සම්බන්ධව ප්‍රතිපාදන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 55 වන වගන්තියට සිදු කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

***12 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71අ වන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර නීතිය බලපෑම වනුයේ, අධිකරණ ආඥා භාරදීම පිළිබඳ ප්‍රතිපාදන සැලසීම වේ.

***13 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, විත්තිකරුගේ පැහැර හැරීම හේතු කොටගෙන ඔහුට විරුද්ධව නඩුව ඒක පාර්ශ්විකව විභාග කිරීමට නියම කරනු ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී හෝ විත්තිකරුගේ පැහැර හැරීම හේතු කොටගෙන ඔහුට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් වාර්තා කරනු ලැබ තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාර දීම සිදු නොකර ඇති ඕනෑම අවස්ථාවක හෝ සාධාරණ හේතු තමාට තිබූ බව අධිකරණයට කරුණු වාර්තා කිරීමට විත්තිකරුවකුට අවසරදීමට ප්‍රතිපාදන සැලසීම වේ.

***14 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ අංක 7, අංක 16අ සහ අංක 17 දරන ආකෘති සංශෝධනය කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන, 55 වන, 60 වන සහ 71අ වන යන වගන්තිවලට සිදු කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ. 72/2021

### (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2024 අංක    දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*101 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන වගන්තියේ "තීන්දු ප්‍රකාශය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> ""ඉලෙක්ට්‍රොනික" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මගින් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(අ) පැමිණිලිකාර පාර්ශ්වකරුවකු හෝ විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ; හෝ".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ-

(අ) (ආ) ඡේදයේ "අන්තර්ගත විය යුතු ය;" යන වචන වෙනුවට "අන්තර්ගත විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එහි (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් කැඳවීම් නියෝගයක්, දැන්වීමක් හෝ වෙනත් යම් නෛතික ලේඛනයක් ද ලේඛනගත නීතිඥවරයකු වෙත භාරදිය හැකි විද්‍යුත් තැපැල් ලිපිනයක් සහ ජංගම දුරකථන අංකයක් එම පත්කිරීමට ඇතුළත් කළ යුතු ය;

(ඈ) යම් පාර්ශ්වකරුවකුගේ, පිළිවෙළින් ලියාපදිංචි කළ ලිපිනය, ලියාපදිංචි කළ දුරකථන අංකය සහ ලියාපදිංචි කළ විද්‍යුත් තැපැල් ලිපිනය ලෙස සලකනු ලැබිය යුතු එකී පාර්ශ්වකරුගේ ලිපිනය, දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම් එය ද සඳහන් කරමින් පිටපත් දෙකකින් පළමුවන උපලේඛනයේ අංක 16අ දරන ආකෘතියට සාරානුකූල වූ සන්දේශයක් ඇතුළත් විය යුතු ය. එකී දැන්වීම් හෝ වෙනත් නෛතික ලේඛන ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රම හරහා භාරදීමේ වියදම පියවීම සඳහා අවශ්‍ය මුදලේ වටිනාකමින් යුතු මුද්දර ඒ සන්දේශය සමග ලේඛනගත නීතිඥවරයා විසින්, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය;";

(2) (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්-

"(2අ) (අ) ලේඛනගත නීතිඥවරයකු විසින් යම් පාර්ශ්වකරුවකු නියෝජනය කරනු ලබන අවස්ථාවක, එම නීතිඥවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි එම පාර්ශ්වකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය, විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ වෙනත් යම් හඳුනාගැනීමේ ක්‍රමයක් පත්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු අතර එම පාර්ශ්වකරු පිළිබඳ හඳුනාගැනීම සහතික කරන්නා වූ පිටසනක් ද එහි කරනු ලැබිය යුතු ය. පාර්ශ්වකරු සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් වන විට, අවස්ථාවෝචිත පරිදි එම සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව යටතේ පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින පාර්ශ්වකරුවකු විසින්, (1) වන උප වගන්තිය යටතේ පත්වීම අත්සන් කිරීම සඳහා ඔහුගේ ලේඛනගත නීතිඥවරයා හමුවීමට අපොහොසත්

වන අවස්ථාවක දී, එකී පත්වීම එම තැනැත්තා හඳුනාගැනීම සහතික කරනු ලබන පහත සඳහන් කුමන හෝ බලයලත් තැනැත්තකු ඉදිරියේ අත්සන් කරනු ලැබිය යුතු ය:-

(i) එම පාර්ශ්වකරු පදිංචි රටේ නීතිඥවරයකු, සොලිස්ටර්වරයකු, හෝ නොතාරිස්වරයකු; හෝ

(ii) එම පාර්ශ්වකරු පදිංචි රටේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ මහකොමසාරිස්වරයා, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපතිවරයා හෝ කොන්සල් කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු හෝ කොන්සල් නිලධරයකු.

(ඇ) නිශ්චිත කාලසීමාව ඇතුළත පත්වීමෙහි මුල් පිටපත ඉදිරිපත් කිරීමට යම් ප්‍රමාදයක් හෝ යම් අපහසුතාවක් සිදුවන අවස්ථාවක දී, අධිකරණය විධාන කරනු ලැබිය හැකි යම් සාධාරණ කාලසීමාවක් ඇතුළත එම පත්වීමෙහි මුල් පිටපත ඉදිරිපත් කිරීමට යටත්ව, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන මුල් පිටපතෙහි පිටපතක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

"(2) (අ) නඩුවක ලේඛනගත නීතිඥවරයකු මගින් පෙනී නොසිටින්නා වූ සෑම පාර්ශ්වකරුවකු ම අන්‍යාකාරකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, සිතාසියෙ හි නිශ්චිතව දක්වා ඇති දිනයෙහි හෝ ඊට පෙර මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ එම පාර්ශ්වකරුවා වෙත භාරදෙනු ලැබීමට නියමිත දැන්වීම් හෝ වෙනත් යම් නෛතික ලේඛන භාරදීම සඳහා පිළිවෙළින් එම පාර්ශ්වකරුවාගේ ලියාපදිංචි ලිපිනය, ලියාපදිංචි ජංගම දුරකථන අංකය සහ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනය ලෙස සලකනු ලැබිය යුතු ලිපිනයක්, ජංගම දුරකථන අංකයක් සහ විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම් විද්‍යුත් තැපැල් ලිපිනය ද සඳහන් කරමින් පළමුවන උපලේඛනයේ අංක 16අ දරන ආකෘතියට සාරානුකූල වූ සන්දේශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත පිටපත් දෙකකින් සපයනු ලැබිය යුතු ය. සෑම පාර්ශ්වකරුවකු

විසින් ම එම ලිපිනයෙහි, ජංගම දුරකථන අංකයෙහි හෝ විද්‍යුත් තැපැල් ලිපිනයෙහි වන යම් වෙනසක් පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත වහාම දැනුම් දිය යුතු ය.

(ආ) සෑම පාර්ශ්වකරුවකු විසින් ම, ලියාපදිංචි තැපෑලෙන් එම දැන්වීම් හෝ වෙනත් නෛතික ලේඛනයක් භාරදීමේ වියදම පියවීම සඳහා අවශ්‍ය මුදලේ වටිනාකමින් යුතු මුද්දර ඒ සන්දේශය සමග රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) පාර්ශ්වකරුවකු ලේඛනගත නීතිඥවරයකු මගින් පෙනී සිටින අවස්ථාවක, 27 වන වගන්තිය යටතේ එම ලේඛනගත නීතිඥවරයාගේ පත්වීමෙ හි ඇතුළත් ඔහුගේ ලිපිනය, ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය, ඔහුගේ පත් කිරීම බලාත්මකව පවතින තාක් කල් එම නීතිඥවරයාගේ ලියාපදිංචි ලිපිනය, ලියාපදිංචි ජංගම දුරකථන අංකය සහ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනය ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) යම් පාර්ශ්වයක් වෙත භාරදෙනු ලැබීමට නියමිත යම් දැන්වීමක් හෝ වෙනත් නෛතික ලේඛනයක්,-

(i) එම පාර්ශ්වකරුගේ ලියාපදිංචි ලිපිනයට, ලියාපදිංචි ජංගම දුරකථන අංකයට හෝ ලියාපදිංචි ඉලෙක්ට්‍රොනික විද්‍යුත් තැපැල් ලිපිනයට; හෝ

(ii) යම් පාර්ශ්වකරුවකු ලේඛනගත නීතිඥවරයකු මගින් පෙනී සිටින අවස්ථාවක සහ එම පත් කිරීම බලාත්මකව පවතින අවස්ථාවක, එම ලේඛනගත නීතිඥවරයාගේ ලියාපදිංචි ජංගම දුරකථන අංකයට හෝ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට,

ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රම හරහා භාරදෙනු ලබන්නේ නම්, එය ප්‍රමාණවත් භාරදීමක් ලෙසට සළකනු ලැබිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයා විසින් තමාට සපයන ලද අංක 16අ දරන ආකෘතියට සාරානුකූල වූ සන්දේශයේ එක් පිටපතක්, නඩු වාර්තාවේ කොටසක් ලෙස ගොනු කොට තැබිය යුතු අතර අනෙක් පිටපත වෙනම ලෙජරයක තබා පවත්වාගෙන යා යුතු ය.”.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"සිතාසි භාරදීම

59. (1) (අ) සාමාන්‍යයෙන් ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් සිතාසි භාරදෙනු ලැබිය යුතු ය.

(ආ) විද්‍යුත් තැපෑල හරහා ද සිතාසි භාරදීම සිදුකිරීමට පැමිණිලිකරු අපේක්ෂා කරන අවස්ථාවක දී පැමිණිලිකරු විසින් අවශ්‍ය සියලු ලේඛන ඉලෙක්ට්‍රොනික ස්වභාවයෙන් අදාළ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, එම සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයට හෝ එහි ප්‍රධාන ව්‍යාපාර ස්ථානයට ලියාපදිංචි තැපෑලෙන්, කුරියර් සේවාව මගින් හෝ විද්‍යුත් තැපෑල ඇත්නම් එමගින් සිතාසි භාරදෙනු ලැබිය හැකි ය.

(3) විත්තිකරු රාජ්‍ය නිලධරයකු වන අවස්ථාවක, අධිකරණය විසින් ඒ විත්තිකරු සේවයෙහි නියුක්තව සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් ඒ සිතාසි යවනු ලැබිය හැකි අතර, විත්තිකරු වෙත ඒ සිතාසි පෞද්ගලිකව ම භාරදෙනු ලැබීමට සැලැස්වීම ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ කාර්යය විය යුතු ය.

(4) විත්තිකරු වෙනත් තැනැත්තකු යටතේ සේවයෙහි නියුක්තව සිටින බවට බැලූ බැල්මට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් සේවායෝජක වෙත ඔහුගේ ව්‍යාපාරික ස්ථානය වෙත හෝ සේවායෝජකයා සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ යම්

ලේකම්වරයකු, කළමනාකරුවකු හෝ වෙනත් සමාන නිලධරයකු වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් සිතාසි යවනු ලැබිය හැකි අතර, විත්තිකරු වෙත ඒ සිතාසි පෞද්ගලිකව ම භාර දෙනු ලැබීමට සැලැස්වීම අවස්ථාවෝචිත පරිදි ඒ සේවායෝජකයන් හෝ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(5) ඉහත සඳහන් ආකාරයට විත්තිකරුවකු වෙත සිතාසි භාරදීමෙන් පසු, ඔහු පුද්ගලිකව ම අධිකරණයෙහි පෙනී සිටින අවස්ථාවක, ඔහු විසින් ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ අධිකරණය විසින් සුදුසු යැයි සළකනු ලබන වෙනත් යම් හඳුනාගැනීමේ ක්‍රමයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ-

"දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා" යන්නෙන්-

(අ) එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් අංශයක සාමාජිකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ අංශයේ අණදෙන නිලධරයා අදහස් වේ;

(ආ) එය පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ පළාත් පාලන ආයතනය මහ නගර සභාවක් නම්, ඒ සභාවේ නාගරික කොමසාරිස්වරයා සහ ඒ පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම්, ඒ සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ඉන් අදහස් වේ;

(ඇ) එය වෙනත් යම් රාජ්‍ය නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ තැනැත්තා සේවයෙහි නියුක්ත රජයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ඉන් අදහස් වේ; සහ

"ජාතික හැඳුනුම්පත" යන්නෙන්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"පෞද්ගලිකව භාර දීම

60.(1) (අ) භාරදීම, 59 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රමයකට කළ නොහැකි වූ බව වාර්තා කරනු ලැබූ අවස්ථාවක හෝ සිතාසි භාරදෙනු ලැබූ නමුත් පැමිණ පෙනී සිටීම විත්තිකරු විසින් පැහැර හැර ඇති අවස්ථාවක කැඳවීම් නියෝග භාරදෙන්නාගේ මාර්ගයෙන් ඒ සිතාසි පළමුවන උපලේඛනයේ අංක 17 දරන ආකෘතියෙහි වූ අණ පත්‍රයක් ද සමග විත්තිකරු වෙත ගෙනගොස් භාරදීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් ඔහු වෙත භාර දෙන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය යුතු ය. සමාගමක් හෝ පෞද්ගලිකව සංස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ලේකම්වරයාට හෝ ඒ හා සමාන නිලධරයකුට නැතහොත් අධ්‍යක්ෂවරයකුට හෝ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තාට හෝ ඒ සිතාසි ගෙනගොස් භාරදීම් හෝ ඉදිරිපත්කර භාරදීම් සිදු කරනු ලැබිය හැකි ය.

(ආ) (i) විත්තිකරු වෙත සිතාසි භාරදීමෙන් පසු, කැඳවීම් නියෝග භාරදෙන්නා විසින්, සිතාසි භාරදුන් බවට පිළිගැනීමක් ලෙස අණ පත්‍රයේ එම විත්තිකරුගේ අත්සන හෝ මහපට ඇඟිලි සළකුණ ලබා ගත යුතු ය.

(ii) කැඳවීම් නියෝග භාරදෙන්නා විසින්, විත්තිකරු වෙත සිතාසි භාරදුන් ආකාරය දක්වමින් සිතාසි භාරදෙනු ලැබූ තැනැත්තාගේ අනන්‍යතාව, දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ තොරතුරු ද ඇතුළත් වාර්තාවක් ද සමග අණ පත්‍රය අධිකරණය වෙත භාරදෙනු ලැබිය යුතු ය. සිතාසි භාරදුන් බවට පිළිගැනීමක් ලෙස විත්තිකරු විසින් අණපත්‍රයේ සිය අත්සන හෝ මහපට ඇඟිලි සළකුණ තැබුවේ ද, තැබීම ප්‍රතික්ෂේප කළේ ද යන වග ද වාර්තාවෙහි සඳහන් කළ යුතු ය.

(iii) යම් විත්තිකරුවකු විසින් අණ පත්‍රයේ අවස්ථාවෝචිත පරිදි, සිය අත්සන හෝ මහපට ඇඟිලි සලකුණ තැබීම ප්‍රතික්ෂේප කිරීම, සිතාසි භාරදීම අවලංගු කරනු ලැබීමක් ලෙස සළකනු නොලැබිය යුතු ය.

(2) නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් පසුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් භාරදීම ක්‍රියාත්මක කළ නොහැකි වුවහොත්, පැමිණිලිකරුගේ උපරිම දැනුමට අනුව විත්තිකරු, ශීර්ෂයේ සඳහන් ලිපිනයෙ හි පදිංචිව සිටින බවත් ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් නොවන බවත් සඳහන් කරමින් පැමිණිලිකරුගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අනතුරුව, අධිකරණය විසින්, විත්තිකරු සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක හෝ සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් වන විට, එම සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ හෝ සාමාන්‍ය ව්‍යාපාර ස්ථානයේ හෝ කාර්යාලයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සිතාසිය අලවනු ලැබීමට

කැඳවීම් නියෝග භාරදෙන්නාට නියෝග කරනු ලැබිය හැකි අතර, ඒ සෑම අවස්ථාවක දී ම ඒ සිතාසිය යථා පරිදි විත්තිකරු වෙත භාරදෙනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි අධිකරණ බල සීමාවෙන් පිටත සිතාසි භාරදීම සඳහා අධිකරණය විසින් කැඳවීම් නියෝග භාරදෙන්නා වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(4) පැමිණිලිකරු විසින් දෙනු ලැබූ විත්තිකරුගේ අවසන් වරට දැනගත් ලිපිනයට පෞද්ගලිකව විත්තිකරු වෙත සිතාසි භාරදීමට නොහැකි වූ බව කැඳවීම් නියෝග භාරදෙන්නා විසින් වාර්තා කරනු ලබන අවස්ථාවක සහ විත්තිකරු වාසය කරන ස්ථානය පිළිබඳ පැමිණිලිකරු නොදැනුවත් බව දිවුරුම් ප්‍රකාශයක් මගින් පැමිණිලිකරු විසින් අධිකරණයට දැනුම් දෙනු ලබන අවස්ථාවක එම දිවුරුම් ප්‍රකාශයේ ඇතුළත් දෑ පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු, අධිකරණය විසින් එක් එක් අවස්ථාවේ දී විධාන කරනු ලැබිය හැකි පරිදි සිතාසි භාෂා තුනෙන් ම පුවත්පත්වල පළකරනු ලැබීමෙන් ඒවා භාරදිය යුතු බව අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(5) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා -

"කැඳවීම් නියෝග භාරදෙන්නා" යන්නෙන් අධිකරණය විසින්, විධාන කරනු ලබන පරිදි අධිකරණ බල සීමාව ඇතුළත හෝ අධිකරණ බලසීමාවෙන් පිටත අධිකරණයේ ලේඛන භාරදෙන්නා වූ පිස්කල්වරයකු, නියෝජ්‍ය පිස්කල්වරයකු, විනිසුරුවරයා හෝ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය දෙනු ලබන නිලධරයකු හෝ විත්තිකරු පදිංචිව සිටින්නේ යම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තුළ ද ඒ ග්‍රාම නිලධරයා අදහස් වේ.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

''භාරදීම ඔප්පු කිරීම

61.(අ) ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව හරහා සිතාසියක් භාරදෙනු ලබන විට, ලියාපදිංචි තැපැල් ලිපියේ කුවිතාන්සිය හෝ කුරියර් සේවාව හරහා ගෙනගොස් භාරදුන් බවට සාධක;

(ආ) විද්‍යුත් තැපෑල මගින් සිතාසියක් භාරදෙනු ලබන විට, නඩු වාර්තාවේ කොටසක් ලෙස ගොනු කරන ලද රෙජිස්ට්‍රාර්වරයා විසින් විද්‍යුත් තැපෑලෙන් යැවූ බවට සාධක;

(ඇ) පුවත්පත්වල පළකිරීමෙන් සිතාසියක් භාරදෙනු ලබන විට, එම ප්‍රකාශනයන් හි පිටපත්; හෝ

(ඈ) වෙනත් යම් ආකාරයකට සිතාසියක් භාරදෙනු ලබන විට, එම භාරදීම පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක්,

සිතාසිය භාරදෙනු ලැබූ බවට සහ ඒ භාරදීමේ දිනය පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, එය සාක්ෂියේ දී ආවේශ්‍ය විය යුතු ය. තව ද, එහි ඇතුළත් ප්‍රකාශ, පටහැනි තත්ත්වය ඔප්පු කළහොත් මිස හා ඔප්පු කරනු ලබන තෙක් නිරවද්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"අනුයෝජිතයා වෙත සිතාසි භාරදීම හෝ නිශ්චල දේපළ මත ඇලවීම

66. නිශ්චල දේපළක් හෝ ඒ හා සම්බන්ධව කරන ලද වරදක් වෙනුවෙන් වන්දි හෝ සහනයක් ලබා ගැනීම සඳහා පවරන ලද නඩුවක දී, විත්තිකරු වෙත පුද්ගලිකව ම සිතාසි භාරදිය නොහැකි නම්,

එම දේපළ භාරව සිටින විත්තිකරුගේ යම් අනුයෝජිතයකු වෙත සිතාසි භාරදීම කළ හැකි අතර එවැනි අනුයෝජිතයකු සොයාගත නොහැකි අවස්ථාවන් හි දී, එම දේපළෙ හි යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක සිතාසි අලවනු ලැබිය යුතු බවට අධිකරණය විධාන කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"බන්ධනාගාරයෙහි සිටින විත්තිකරුවකු වෙත සිතාසි භාරදීම

68. (1) විත්තිකරු බන්ධනාගාරගතව සිටින්නේ නම්, විත්තිකරු රඳවාගෙන ඇති බන්ධනාගාරය භාරව සිටින නිලධරයා වෙත කැඳවීම් නියෝග භාරදෙන්නා විසින් සිතාසිය භාරදෙනු ලැබිය යුතු අතර ඒ නිලධරයා විසින් පෞද්ගලිකව විත්තිකරු වෙත සිතාසිය භාරදීමට කටයුතු සැලැස්විය යුතු අතර විත්තිකරු විසින් සිතාසිය ලබාගත් බවට පිළිගැනීමක් ලබාගත යුතු ය.

(2) බන්ධනාගාර භාර නිලධරයා විසින්, සිතාසිය භාරදුන් බවට ප්‍රකාශයක් එය මත සටහන් කොට අත්සන් තබා අණපත්‍රය නිකුත් කළ අධිකරණයට පිස්කල් මාර්ගයෙන් එය ආපසු යැවිය යුතු ය.

(3) යම් විත්තිකරුවකු සිතාසිය කැඳවනු ලබන දිනයේ දී බන්ධනාගාරයේ සිටින අවස්ථාවක, බන්ධනාගාරය භාරව සිටින නිලධරයා විසින් විත්තිකරු අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ "විධාන කළ යුතු ය." යන වචන වෙනුවට "විධාන කළ යුතු ය. කුරියර් සේවාව මගින් හෝ විත්තිකරු පදිංචිව සිටින රටෙහි නීතිය මගින් බලය ලබා දෙන යම් නීතිඥ සේවා සපයන ආයතනයක් විසින් එම භාරදීම සිදුකළ හැකි අතර සිතාසිය පෞද්ගලිකව භාරදීම පිළිබඳ සාධක අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට VIIIඅ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ VIIIඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය:-

"VIII අ පරිච්ඡේදය

**ආඥා භාරදීම**

ආඥා පිළිබඳ සන්නිවේදනය කිරීම

71අ. ලේඛන භාරදීමට අමතරව, වාරණ නියෝගයක්, ඉන්ජන්ශන් තහනමක්, අතුරු ඉන්ජන්ශන් තහනමක්, තහනම් නියෝගයක් සහ අතුරු ආඥාවක් ඇතුළු අධිකරණ නියෝග පිළිබඳ විද්‍යුත් හෝ දුරකථන මෙවලම් මගින් අදාළ පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය කිරීමට අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (අ) විත්තිකරුගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඔහුට විරුද්ධව නඩුව ඒක පාක්ෂිකව විභාග කිරීමට නියම කරනු ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී;

(ආ) විත්තිකරුගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඔහුට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් වාර්තා කරනු ලැබ තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාරදීම සිදු නොකර ඇති ඕනෑම අවස්ථාවක දී; හෝ

(ඇ) විත්තිකරුගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඔහුට විරුද්ධව වාර්තා කරනු ලැබූ තීන්දු ප්‍රකාශය භාර දෙනු ලැබීමෙන් දින දහ හතරක් ඇතුළත,

පැමිණිලිකරුට දැන්වීමක් ද සහිතව විත්තිකරු අධිකරණයට ඉල්ලීමක් කර ඉක්බිතිව තමාට සිතාසිය නොලැබුණු බව හෝ ඒ පැහැර හැරීමට සාධාරණ හේතු තමාට තිබුණු බවට, අධිකරණය සෑහීමට පත් කරන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, අධිකරණය

විසින්, නඩුව, ඒක පාර්ශ්වික නඩු විභාගය සඳහා නියම කරන ලද ආඥාව, නඩු තීන්දුව සහ තීන්දු ප්‍රකාශය අවලංගු කොට ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකරණය විසින් සුදුසු යැයි සළකනු ලබන නියම මත ඒ පැහැර හැරීමේ අවස්ථාවේ සිට ස්වකීය විත්තිවාචකය පවත්වාගෙන යාමට විත්තිකරුට අවසර දිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 653 වන වගන්තියේ "රුපියල් එක් දහස් පන් සියයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියන දෙකක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 653 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එහි අංක 7 දරන ආකෘතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"අංක 7

[27 වන වගන්තිය]

**ලේඛනගත නීතිඥවරයකු පත්කිරීමේ ආකෘතිය**

සියල්ලෝම මෙයින් දැනගනිත්වා ........................................ හි .......................... දරන ජාතික හැඳුනුම්පත හිමි ............................................................................වන මම/අපි, නීතිඥවරයකු වූ ......................................, ...................................... සඳහා ද ...................................... නාමයෙන් ද මා/අප වෙනුවට ද ...................................... ඉදිරියේ පෙනී සිටීමටත් [එහි දී නඩු පැවරීමට හෝ විත්තාවාචක ඉදිරිපත් කිරීමටත් (නඩුව කුමක් ද යනු දක්වමින් අවස්ථානුකූලව යොදන්න.)]

ඒ නඩුවේ එකී ...................................... විසින් ඔහුට ගෙවනු ලබන සියලුම මුදල් භාරගැනීමට හා ගැනීමට ද, ...................................... වෙනුවෙන් තැන්පත් කරනු ලැබිය හැකි යම් මුදලක් හෝ මුදල්

ගෙවනු ලැබීම සඳහා එකී අධිකරණයෙන් යම් ආඥාවක් හෝ ආඥා ලබා ගැනීම සඳහා මෝසම් ඉදිරිපත් කිරීමට ද, එකී යම් ආඥාවක් හා ආඥා ලබා ගැනීමට ද, ඒ සඳහා අවශ්‍ය සියලුම කුවිතාන්සි, මුක්ත කිරීම් හා නිදහස් කිරීම් දීමට ද, අවශ්‍ය වුවහොත්, බේරුම්කරුවන්ගේ තීරණය හා තීන්දුව සඳහා නඩුව යොමු කිරීමට ද ................ ................. සඳහා බේරුම්කරුවකු නම් කිරීමට ද, එකී කාර්යය සඳහා යම් මෝසමක්, සැලකිරීමක්, හෝ බැඳුම්කරයක් අත්සන් කිරීමට ද, අවශ්‍ය වුවහොත්, ................................... සඳහා ඒ නීතිඥයාට සුදුසු හා නිසි යැයි හැඟෙන පරිදි අධිකරණයේ නඩු තීන්දුවකට, ආඥාවකට, දණ්ඩන නියමයකට, මුල් තීන්දු ප්‍රකාශයකට හෝ අවසාන තීන්දු ප්‍රකාශයකට විරුද්ධව අභියාචනා කිරීමට ද, ඒ අභියාචනය ගෙනයෑමේ නඩු කටයුතුවල දී, අවශ්‍ය වන කිනම් බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක් ..................................... සඳහා හා මාගේ/අපගේ නාමයෙන් මාගේ/අපගේ ක්‍රියාවක් පරිද්දෙන්, අත්සන් කිරීමට ද, ඒ ...................................... අධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් පිට ඒ .................................... තැනැත්තාට පෞද්ගලිකව හා ඔහුගේ දේපළවලට විරුද්ධව ඉන් යටත් ක්‍රියාවේ යෙදවීමට ද, ............................. නීතිඥයා වශයෙන් නම් කොට, සංස්ථාපනය කොට, පත්කොට ඇති අතර ම මෙයින් නම් කොට, සංස්ථාපනය කොට, පත් කරමි/පත් කරමු.

සියලුම නීත්‍යනුකූල මාර්ග හා ක්‍රම අනුගමනය කිරීමට හා ප්‍රයෝජන ගැනීමට ද ............................. පුද්ගලිකව පෙනී සිට නීත්‍යනුකූලව කළ හැකි හෝ කරනු ලබන ඒ කරුණු පිළිබඳව හා සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි සියලුම ක්‍රියා, කරුණු හා දේවල් කිරීමට හා ඉෂ්ට කිරීමට ද, අවශ්‍ය වුවහොත්, නීතිඥයකු හෝ නීතිඥයන් හෝ අධිනීතිඥවරයකු හෝ අධිනීතිඥවරයන් එක් කෙනෙකු හෝ වැඩි ගණනක් පත් කිරීමට ද, ඒ පත් කිරීම් නැවත කැමැත්ත පරිදි ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ද, ............................. ඒ නීතිඥයා වන ................................ ට වැඩිදුර බලය පවරමි/පවරමු. තව ද, හැම ආකාරයක ම සියලුම අක්‍රමිකතාවලින් නිදහස් කිරීමට ද ඒ නීතිඥයා හෝ ඔහුගේ ආදේශකයා හෝ ආදේශකයන් හෝ ඒ අධිනීතිඥයා හෝ ඔහුගේ ආදේශකයා හෝ ආදේශකයන් හෝ ඒ අධිනීතිඥවරයා හෝ අධිනීතිඥවරයන් විසින් මේ සම්බන්ධයෙන් කරනු ලබන සියල්ල අනුමත කිරීමට ද, ස්ථිර කිරීමට ද ඒවාට ඉඩ හැරීමට ද ..................,,,,,,,,............ වැඩිදුරටත් පොරොන්දු වන අතරම එකඟ ද වෙමි/වෙමු.

....................................
අත්සන/අත්සන්

සාක්ෂි වශයෙන් ................................... දී 20...... ..................... මස ..................... වන දින ............................ විසින් අත්සන් තබන ලදී.

.................................................. දරන ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත/රියදුරු බලපත්‍රයට අනුව ඉහත කී ..............................................................(නම/නම්) ගේ අනන්‍යතාව පිළිබඳ සෑහීමට පත්වන බව සහ ...................................... වන දින ඔහු/ඇය/ඔවුන් මා ඉදිරිපිට දී තැබූ බව මම සහතික කරමි.

.....................................................

ලේඛනගත නීතිඥයා/නීතිඥවරයා/සොලිස්ටර්වරයා/
නොතාරිස්වරයා/තානාපතිවරයා/මහ
කොමසාරිස්වරයා/රාජ්‍ය තාන්ත්‍රික නිලධරයා/
කොන්සල් නිලධරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

ලිපිනය :
දුරකථන අංක : කාර්යාලීය :
ජංගම දු. අ. :
විද්‍යුත් තැපැල් ලිපිනය :
ෆැක්ස් අංකය :

.............................................................

ලේඛනගත නීතිඥවරයාගේ අත්සන
(නිල මුද්‍රාව).";

(2) එහි අංක 16අ දරන ආකෘතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"අංක 16අ

[27 වන සහ 55 වන වගන්ති]

**ලියාපදිංචි ලිපිනය/ලියාපදිංචි දුරකථන අංකය/ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනය පිළිබඳ සංදේශය**

........................................................ වාණිජ මහාධිකරණයේ දී/දිසා අධිකරණයේ දී/ප්‍රාථමික අධිකරණයේ දී ය.

නඩු අංකය :

................................................. (පැමිණිලිකරු/ විත්තිකරු/ පෙත්සම්කරු/ වගඋත්තරකරු/එකතු කිරීමට/ආදේශ කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වය) වන මම, මේ සංග්‍රහය යටතේ වන දැන්වීම් සහ මා වෙත භාරදීමට නියමිත වෙනත් සියලුම නෛතික ලේඛන භාරදීම සඳහා මාගේ ලිපිනය/ජංගම දුරකථන අංකය/විද්‍යුත් තැපැල් ලිපිනය මෙයින් සපයමි.

ලියාපදිංචි ලිපිනයෙහි/ලියාපදිංචි ජංගම දුරකථන අංකයෙහි/ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයෙ හි යම් වෙනසක් ඇතිවුවහොත් වහාම එම ආකෘතියෙන් ම වෙනත් සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් ඒ පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා සිටීමට මම පොරොන්දු වෙමි.

ලිපිනය :
ජංගම දුරකථන අංක :
විද්‍යුත් තැපැල් ලිපිනය :
ෆැක්ස් අංකය :

..............,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,........................

අත්සන
පැමිණිලිකරු/විත්තිකරු/පෙත්සම්කරු/
වගඋත්තරකරු/එකතු කිරීමට/ආදේශ
කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වය.";

(3) එහි අංක 17 දරන ආකෘතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"අංක 17

[60 වන, 71අ වන වගන්ති]

**සිතාසි හෝ ආඥා භාරදීම සඳහා කැඳවීම් නියෝග භාරදෙන්නා වෙත යවන අණ පත්‍රයේ ආකෘතිය**

......................................... පළාතේ පිස්කල්/බලයලත් නිලධරයා/ග්‍රාම නිලධාරි වෙතය.

........................................ අධිකරණය/කොට්ඨාසය

දෙවන පිටපත් සහිතව, මේ සමග ඔබට එවනු ලබන ඉහත සඳහන් නඩුවේ සිතාසි එහි නියම කොට ඇති, එක් එක් තැනැත්තාට නොපමාව භාර දී සිතාසියේ දෙවන පිටපතක් හා පැමිණිල්ලේ පිටපත්වලින් එකක් (නැතහොත් පැමිණිල්ල සමග ඉදිරිපක් කරනු ලබන සංක්ෂිප්ත ප්‍රකාශවලින් එක් පිටපතක්) ඒ එක් එක් තැනැත්තා වෙත තබන්න; නැතහොත් ඔහුට දෙන්න. තව ද 20..................... මස ............. වන දින හෝ ඊට පෙර මේ අධිකරණයට මේ අණ පත්‍රය ඔබ විසින් ක්‍රියාවේ යොදවනු ලැබූ ආකාරය සහතික කර දන්වා එවන්න. ප්‍රදර්ශිකයන් වශයෙන් සිතාසිය ඔබගේ සහතිකයට අමුණා එවන්න.

අධිකරණයේ අණ පරිදි,
(අත්සන් කළේ) .........................
රෙජිස්ට්‍රාර්වරයා

20 .......................... මස ............ වන දින දී ය .".

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව